# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය எனது இல My No } CS/DOS/01/11
ඔබගේ අංකය உமது இல Your No }
දිනය திகதி: Date } 2022.01.03

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරීන් සම්බන්ධ ලිපි ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2017.08.14 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් සංවර්ධන නිලධාරි සේවා අංශය වෙත දෛනිකව ලිපි රාශියක් යොමුවන අතර, එලෙස යොමුවන ලිපි බොහොමයක නිලධාරියාගේ නම පමණක් සඳහන්කොට එවීම නිසා එම ලිපි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේදී අනවශ්‍ය කාලයක් වැය කිරීමට සිදුවන බව නිරීක්ෂණය වේ.

03. එබැවින් සංවර්ධන නිලධාරීන්ගේ ආයතනික කටයුතු සඳහා ලිපි යොමු කිරීමේදී අනිවාර්යයෙන්ම නිලධාරියාගේ පත්වීම් අංකය CS/DOS/XXXXX සඳහන් කොට එවන මෙන් කාරුණිකව දන්වන අතර, එසේ සඳහන් කිරීමකින් තොරව අප වෙත 2022.01.20 දිනෙන් පසුව ලැබෙන ලිපි, පත්වීම් ලිපි අංකය යොදාගෙන නැවත අප වෙත යොමුකිරීමට යළි හරවා එවීමට සිදුවන බව ඉතා කාරුණිකව දැනුම් දෙමි.

04. ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් 75,000 කට අධික ප්‍රමාණයක් වර්තමානයේ සේවයේ නිරතවී සිටින අතර, ඔවුන්ගේ ආයතනික කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම සඳහා සියලු දෙනාගේම සහය අපේක්ෂා කරමි. එබැවින් ලිපි යොමු කිරීමේදී නිලධාරියාගේ පත්වීම් ලිපි අංකය අනිවාර්යයෙන් නිවැරදිව සඳහන් කර එවන ලෙසත්, ලිපි පිටපත් යොමුකිරීමේදී සේවා අවශ්‍යතාවය අනුව අත්‍යවශ්‍ය ලිපි පිටපත් පමණක් යොමුකිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්